**ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය - 2018**

**---------------------------------------------**

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2006 දෙසැම්බර් 14 දින එළඹි අංක එස්ආර්අයි -2217 දරන ණය ගිවිසුමේ 6 උපලේඛනයේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව එවකට උසස් අධ්‍යාපන ,මහාමාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. මාර්ග අංශයේ ආයතන වැඩිදියුණු කිරීම සහ නියමු කාර්යසාධනය පදනම් කරගත් නඩත්තු කොන්ත්‍රාත් සංවර්ධනය කිරීම තුළින් ජාතික මහාමාර්ග ජාලයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම හා මාර්ග අංශයේ ආයතන සවිබල ගැන්වීම ව්‍යාපෘතියේ අරමුණ වේ.ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 21,655 කට සමාන එ.ජ.ඩො. මිලියන 208 ක් වූ අතර ඉන් රු. මිලියන 15,275 කට සමාන එ.ජ.ඩො මිලියන 150 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි.පසුව 2008 පෙබරවාරි 15 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීම සඳහා ණය ගිවිසුම 2008 මැයි 27 දිනට අනුව සංශෝධනය කරන ලදි. ඉහත ණය මුදලට අමතරව, අංක 1355 පී දරණ තවත් ණය ගිවිසුමක් ශ්‍රී ලංකා රජය විසින් ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල සමඟ 2010 ඔක්තෝබර් 04 දින අත්සන් කර තිබුණු අතර මෙම ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 880 කට සමාන එ.ජ.ඩො මිලියන 8ක් වෙන් කිරීමට ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් එකඟවී තිබුණි.ඇමෙරිකන් ඩොලර් මිලියන 85 කට සමාන රුපියල් මිලියන 9350 ක් වටිනා අංක 2767 - එස්ආර්අයි දරණ අමතර ගිවිසුමක් ශ්‍රී ලංකා රජය සමඟ ආසියානු සංවර්ධන අරමුදල 2011 ඔක්තෝබර් 04 දින අත්සන් තබන ලදි. මුල් ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය එහි කටයුතු 2006 අප්‍රේල් 07 දින ආරම්භ කරන ලද අතර 2012 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලසුම්කර තිබුණි. මහාමාර්ග ලේකම් ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම ප්‍රමාද වීම නිසා ව්‍යාපෘතියේ කාලය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් මූල්‍යන ක්‍රියාකාරකම් 2015 ජූනි 30 දින අවසන් කරන ලදි.

## 1.3 මතය

**-----**

මාගේ වාර්තාවේ වගුවේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම පාලනය සම්බන්ධයෙන් චෝදනා ලද අය සතුවේ.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාරතා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

(අ) වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ

මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

(ආ) අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

(ඇ) කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

(ඇ) හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

**පහත නිරීක්ෂණයන් සිදුකරන ලදී.**

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්කරුවන්ට 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රුපියල් මිලියන 116.83, ගිණුම්කරණ දෝෂයක් හේතුවෙන් රුපියල් මිලියන 14.39 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වගකීම අඩුවීම. | ගෙවිය යුතු වැට් (VAT) මුදල පමණක් දක්වා නොමැත. | සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයට ගෙවිය යුතු ශේෂය ගිණුම්ගත කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | ව්‍යාපෘතිය විසින් ක්‍රියාවට නංවන ලද ඉදිකිරීම් කටයුතු 2016 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණ කර තිබුණද ව්‍යාපෘතියේ වත්කම් අදාල ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත භාරදීමට සහ 2018 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමේ මූල්‍ය | ගිණුම්කරණ ප්‍රතිපත්ති වැරදි ලෙස භාවිතා කිරීම. | සමථයකට පත් නොවුණු කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම් හේතුවෙන් අවසන් කිරීමේ ගිණුම සකස්කර නොතිබුණි. 2019 වර්ෂයේදී සමථයකට පත්කර අවසන් කිරීමේ ගිණුම් සකස්කිරීමට | අවසන් කරන ලද ව්‍යාපෘතිවල වත්කම් හා වගකීම් මාර්ග සංවර්ධන අධිකාරියට පැවරීම හා අවසන් කිරීමේ ගිණුම සකස් කිරීමට පියවර ගත යුතු වේ. |

| | |
|---|---|
| ප්‍රකාශන පිළියෙල කිරීමේ අරමුණු සඳහා ක්‍රියාත්මක කරවීමේ ආයතනය විසින් අවශ්‍ය උපදෙස් නිකුත් කර නොතිබුණි. | බලාපොරොත්තු වේ. |

**03. භෞතික කාර්යසාධනය**

--------------------------

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

-----------------------------------------------------

ලද තොරතුරු වලට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලසුම මගින් අවසන් කිරීමට නියමිතව තිබු ජාතික මාර්ග 09 ක කිලෝමීටර් 279 ක් අතුරින් ජාතික මාර්ග 05 ක කිලෝමීටර් 244 ක් වැඩිදියුණු කිරීම් හා පුනරුත්ථාපන කටයුතු ව්‍යාපෘතිය මගින් අවසන් කර 2016 දෙසැම්බර් 31 වන විට ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත භාරදී තිබුණි. මීට අමතරව ව්‍යාපෘතිය මගින් රුපියල් මිලියන 2,918 ක වියදමින් මහා මාර්ග ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර 2016 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. කෙසේ වෙතත් 2018 දෙසැම්බර් 31 වන විටත් ගොඩනැගිල්ලේ ගෘහභාණ්ඩ, සවිකිරීම් සහ අනෙකුත් උපකරණ භාරදීමට පියවර ගෙන නොතිබුණි. තවද ගොඩනැගිල්ල සඳහා අනුකූල අවසන් කිරීමේ සහතිකයක් 2019 නොවැම්බර් 30 වන විටත් නිකුත් කර නොමැති බව නිරීක්ෂණය විය.

**3.2 ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු**

---------------------------------

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ලබාදී ඇති තොරතුරුවලට අනුව, ඉඩම් කැබලි 4,343 ක් අත්පත්කරගැනීම සඳහා ව්‍යාපෘතිය මගින් රු.මිලියන 1163.14 ක වන්දි මුදලක් ගෙවා ඇති අතර ඉඩම් කැබලිවල අයිතිය පැවරීමට සහ ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට 2018 දෙසැම්බර් 31 දින වන විට ද පියවර ගෙන නොතිබුණි. | වන්දි සහ ඒ මත වන පොලි ගෙවීම් සඳහා වන පිරිවැය ඉහළ යෑමේ හැකියාව. | ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ වූ 44 වන වගන්තිය නිකුත්කිරීම සඳහා පොලී ගෙවීම ඇතුළු වන්දි ගෙවිය යුතු වේ. | වත්කම්වල අයිතිය පැවරීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |